**සැමට මැයි දින සුභ පැතුම්**

මැයි පළමුවැනිදා යනු කම්කරුවන් විසින් සිදුකරන ලද අරගල සහ ප්‍රගතිය සමරන දිනයක් පමණක්ම නොවේ. ගෝලීය ඇඟලුම් සැපයුම් දාමයන් මෙහෙයවන සහ ඇඟලුම් සේවකයින් හට යහපත් සේවා තත්වයන් සහ ගෞරවනීය ජීවිතයක් තහවුරු නොකරන විලාසිතා සමාගම්වලල පීඩාකාරී භාවිතයන් නිවැරදි කිරීමේ හදිසි අවශ්‍යතාවය ඉස්මතු කරන දිනයකි.

මෙවර මැයි දිනයේදී අපි ගෝලීය විලාසිතා සැපයුම් දාමයේ සන්නාම වගවීම සඳහා ආසියානු ඇඟලුම් කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ වෘත්තීය සමිතිවල සාමූහික ඉල්ලීම හඳුනාගනිමු. ආසියාවේ ඇඟලුම් කමක්රුවන්ගේ යහපැවැත්ම සඳහා ජීවන වියදම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සැපයුම් දාම නියාමනය වෙනුවෙන් අඛණ්ඩව සටන් කිරීමට AFWA හි කැපවීම් නැවත නැවතත් තහවුරු කිරීමට කැමැත්තෙමු.

**සැපයුම් දාමවල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වලට එරෙහිව වෙළඳ නාම වගවීමට ලක් කිරීම**

වෙළඳ සන්නමවල විනිවිද භාවයක් නොමැති මිලදී ගැනීමේ තත්වයන් සහ ඔවුන්ගේ සැපයුම් දාමයේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ආමන්ත්‍රණය කිරීම ප්‍රතික්ෂේප කිරීම ඇඟලුම් කමර්ාන්තයේ බලය අයුතු ලෙස බෙදාහැරීම පෙන්නුම් කිරීමට එක් සාධකයක් වේ.

එක් උදාහරණයක් ලෙස කෝවිඩ්-19 වසංගතයෙන් වසර තුනක් ගත වී ඇති අතර, මිලියන සංඛ්‍යාත ආසියානු ඇඟලුම් සේවකයින් ඇණවුම් අවලංගු කිරීම් හෝ ඇනවුම් සංඛ්‍යාව අඩු කිරීම නිසා තවමත් ඔවුන් හට ප්‍රධාන විලාසිතාවලින් ගෙවිය යුතු වැටුප් ලැබී නොමැත. මෙම සේවකයින්ගෙන් වැඩි පිරිසක් කනතාවන් වේ.

නොසැලකිලිමත් ලෙස මේ ආකාරයට ඔවුන් බලය අවභාවිතා කිරීමට සාධක කිහිපයක් බලපාන අතර, වඩාත්ම හේතු වන්නේ රැකියා අහිමි වේ යැයි බියෙන් , ඕනෑම අසාධාරණයකට එරෙහිව සේවකයින් කතා කිරීම සීමා කිරීම සහ කම්කරුවන් හට ලැබෙන ඉතා අඩු - දරිද්‍රතා මට්ටමේ වැටුප් වේ.

ඇඟලුම් සන්නාම නිෂ්පාදන රටවල වැටුප් ප්‍රමිතීන්ට අදාළව බිම් මට්ටමේ සේවකයින්ගේ භූමිකාව නොසලකා හැර තිබෙනවා පමණක් නොව, මෙම දුවර්ලතා, තීරණ ගැනීමේදී, කම්කරුවන් ගේ ජීවිත වලට හානිකර ලෙස බලපාන අයුරින් හසුරවා ඇත.

කම්කරුවන් ලබන දරිද්‍රතා මට්ටමේ වැටුප පවා සූරාකමින්, කම්කරුවන් අත්විඳින ආන්තික මානුෂිය අබර්ුදයට වෙළඳ නාම සෘජුවම වගකිව යුතුයි. අපි කම්කරුවන්ගේ මව් රටවල වෙළඳ නාමවලට එරෙහිව දිගටම නීතිමය ක්‍රියාමාගර් ගන්න අතර, ඇඟලුම් සේවකයින්ට එරෙහිව සිදු කරන ලද

දැවැන්ත වැටුප් සූරාකෑමේ වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරන වෙළඳ නාමවලට එරෙහිව OECD රාමුව හරහා සංවාදයක් ආරම්භ කරන්නෙමු.

**සන්නාම විසින් ජීවත්වීමට සරිලන වැටුප සහ අවම වැටුප අතර පරතරය වසා දැමිය යුතුය**

සාධාරණ කම්කරු නීති සහ නිමි ඇඳුම් (RMG) අංශය සඳහා ප්‍රමාණවත් අවම වැටුප් ක්‍රියාත්මක කිරීමේදී ජාතික රජයන්හි ප්‍රධාන කාර්යභාරය පිළිබඳව වෘත්තීය සමිති සහ කම්කරු සංවිධාන අවධානය ලක් කරයි. බංග්ලාදේශය, කාම්බෝජය, ඉන්දියාව, ඉන්දුනීසියාව, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව වැනි රටවල ඇඟලුම් කම්කරුවන්, වතර්මාන ජීවන වියදම් සැලකිල්ලට ගනිමින්, අවම වැටුප්වල යුක්ති සහගත හා නීත්‍යානුකූල වැඩිවීමක් ඉල්ලා සිටියි. නමුත් විලාසිතා සන්නාම නැවත ස්ථානගත වීමේ තර්ජනයක ඇති ඇඟලුම් සැපයුම් දාමයක් තුළ, නිෂ්පාදන රටවල රජයන්ට පවා මේ පිළිබඳව කටයුතු කිරීමට ඇත්තේ සීමිත බලයකි.

වෙළඳ සන්නාම, ලාභ ඉපයීම මූලාශ්‍ර කොට ගෙන වැටුප් තව තවත් පහළට තල්ලු කරනවා වෙනුවට, දරිද්‍රතා මට්ටමේ අවම වැටුප් සහ ජීවන වියදමට සරිලන වැටුප අතර පරතරය වසා දැමීමෙන් මූලික මානව හිමිකම් සහතික කළ යුතුය.

නිෂ්පාදන රටවල සාධාරණ ජීවත්වීමට සරිලන අවම වැටුපක් සඳහා වන වෘත්තීය සමිතිවල ඉල්ලීමට සන්නාම සහාය විය යුතු අතර ඔවුන්ගේ සැපයුම් දාමයේ ජීවන වියදමට සරිලන වැටුපක් සඳහා දායක වීමට ඔවුන්ගේ මිලදී ගැනීමේ පිළිවෙත් සකස් කළ යුතුය. මෙම දායකත්වය විලාසිතා සමාගම්වල දැවැන්ත ලාභයෙන් කුඩා ප්‍රතිශතයක් පමණක් වනු ඇත. එවන් දායකත්වයක් මගින් ඊළඟ ආර්ථික අර්බුදයේදී කම්කරුවන් දරිද්‍රතාවයේ ගිලී යාම වැළකෙනු ඇත. ඇඟලුම් කර්මාන්තය සඳහා සරිලන ජීවන වැටුපක් ලඟාකර ගැනීම සඳහා වැටුප් අතර සහ ජීවන වියදම අතර ඇති පරතරය වසා දමන්න!

**සමාජභාවී ප්‍රචණ්ඩත්වය නැති කිරීම සඳහා කම්කරුවන් විසින් මෙහෙයවන ලද මුලපිරීම් සඳහා සන්නාම සහාය විය යුතුය.**

ඇඟලුම් සේවකයින්ගෙන් (80%) කට වඩා කාන්තාවන් වන අතර කර්මාන්තශාලා තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය සහ හිරිහැර (GBVH) අවසන් කිරීම ප්‍රමුඛතාවයකි. AFWA ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර (GBVH) වැලැක්වීම සඳහා කම්කරුවන් සහ වෘත්තීය සමිති විසින් මෙහෙයවනු ලබන මුලපිරීම් වල වැදගත්කම තහවුරු කරන එම ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව බලාත්මක කළ හැකි බැඳීම් ගිවිසුම් ඉදිරිපත් කරයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර අවසන් කිරීම සඳහා වූ ඩින්ඩිගල් ගිවිසුම, ඇතැම් කර්මාන්තශාලාවල හෝ වැඩබිම්වල සේවක හෝ වෘත්තීය සමිති විසින් මෙහෙයවනු

ලබන වැඩසටහනකට සහාය වීම සඳහා කැපවන එවැනි එක් උදාහරණයකි. එවැනි බලාත්මක කළ හැකි බැඳීම් අත්සන් කරන ලෙස අපි තවත් Big Fashion සන්නාමයන්ගෙන් ඉල්ලා සිටිමු. ගිවිසුම් සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥප්තිවලට වඩා හොඳින් අනුකූල වීම සහතික කිරීම, එමගින් සේවකයින් රඳවා ගැනීමේ අනුපාත, ඵලදායිතාව සහ සේවා ස්ථානයේ විශ්වාසය වැඩි දියුණු කිරීම මෙම ගිවිසුම් මගින් සිදු කරනු ලබයි.

**වෘත්තීය සමිතිවලට වැඩි බලයක් !!**

එවැනි ගිවිසුම්වල ප්‍රධාන අංගයක් වන්නේ ගෝලීය සැපයුම් දාමය ප්‍රජාතන්ත්‍රවාදී කිරීමට හැකි වන පරිදි සාමූහිකකරණයට හා කේවල් කිරීමේ බලය වර්ධනය කිරීමට කම්කරුවන්ට ඇති කඩ කළ නොහැකි අයිතියයි. මෙය වෙනත් අයිතිවාසිකම් තහවුරු කිරීමට සහ සාකච්ඡා කිරීමටත් ඇති කේන්ද්‍රීය කොන්දේසියකි. දරිද්‍රතා මට්ටමේ වැටුප්, දුර්වල සෞඛ්‍ය, පෝෂණ මට්ටම් සහ GBVH හි ඉහළ අනුපාතවල බලපෑමෙන් ඇඟලුම් කර්මාන්තය තවමත් නොසැලී සිටින පශ්චාත් Covid ලෝකයක, කම්කරුවන්ගේ ප්‍රශ්නවලට හඬක් දීමට වෘත්තීය සමිති වෙන කවරදාටත් වඩා අවශ්‍ය වේ.

මෙම මැයි දිනයේදී, අපි කම්කරු සමිති පිහිටුවීමට සහ වඩා ඵලදායි සේවා කොන්දේසි, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ජීවන වියදමට සරිලන වැටුප් සඳහා සාමූහිකව කේවල් කිරීමට කම්කරුවන්ට ඇති අයිතිය නැවත තහවුරු කරමු. සන්නාමවලට ඵලදායී සේවා සහ වඩා හොඳ වැටුප් සඳහා කටින් පමණක් සහාය පෑම ප්‍රමාණවත් නොවේ. අපට ඇඟලුම් සේවකයින් නියෝජනය කරන වෘත්තීය සමිති සමඟ සන්නාම මේ පිළිබඳව කැප වී වැඩ කිරීම අවශ්‍යවේ. අපි එකමුතුව සිට සියලු කම්කරුවන්ට යුක්තිය ඉල්ලා සිටිමු. සාධාරණ වැටුප් හා යහපත් සේවා කොන්දේසි සඳහා අරගලය දිගටම පවතින අතර, කම්කරුවන්ට ලැබිය යුතු ගෞරවය සහ එම ගෞරවය ලැබෙන තුරු අපි එකසේ සිටින්නෙමු. කම්කරුවන්ගේ අනාගතය සඳහා වෙළඳ නාම ඔවුන්ගේ වගකීම බැරෑරුම් ලෙස ගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු.